# THE WESTMINISTER MODEL IN SRI LANKA AND ITS CHANGES (Part III)

# විධායකයේ ස්වභාවය සහ බලතල

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විධායකය කැබිනට් විධායකයක් විය. රටේ ප්‍රධාන පාලන සංස්ථාව වූයේ කැබිනට් මණ්ඩලය යි. කැබිනට් මණ්ඩලයේ නායකයා වූයේ අගමැතිවරයා ය. අගමැතිවරයා ලෙස පත් කළ යුතු වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයකගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා ය.

බොහෝ අවස්ථාවල ලංකාවේ කිසිදු දේශපාලන පක්ෂයකට නිශ්චිත බහුතරය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ ලබාගත නොහැකි අවස්ථාවල අගමැතිවරයා තේරීමේ දී අග්‍රාණ්ඩුකාරවරයාට තම අභිමතය අනුව ක්‍රියා කිරීමට අවකාශය තිබිණි.

ClassWork.LK

පත් කළ යුතු ඇමතිවරුන්ගේ සංඛ්‍යාව කොපමණ ද යන්න ව්‍යවස්ථාවේ සඳහන් නොවූ බැවින් එය නිශ්චය කිරීම මුළුමනින් ම සිදු වූයේ අගමැතිවරයාගේ අභිමත පරිදි ය.

අගමැති සතු සෙසු රාජකාරිවලට අමතර ව ආරක්ෂක සහ විදේශ කටයුතු භාර ප්‍රධානයා ලෙස ද ක්‍රියා කළ යුතු යැයි ව්‍යවස්ථාවේ සඳහන් විය. අධිකරණ ඇමති ධූරය සඳහා සෙනෙට් මණ්ඩලයේ සාමාජිකයකු වීම අවශ්‍ය විය.

ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය තීරණ කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද අතර ඉන් පසු ඒ තීරණ නිලධාරීන් මඟින් ක්‍රියාවට නංවනු ලැබිණ.

46 වන වගන්තිය යටතේ රටේ පාලනය සහ විධායකය මෙහෙයවීම භාර වූයේ කැබිනට් මණ්ඩලය වෙතය. පාර්ලිමේන්තුව කැඳවීම සහ විසුරුවා හැරීම සම්බන්ධයෙන් අග්‍රාණ්ඩුකාරවරයාට උපදෙස් දීමේ බලය අගමැති සතු විය. කැබිනට් මණ්ඩලය සාමූහික ව පාර්ලිමේන්තුවට වග කිව යුතු ය.

ClassWork.LK

1972 ව්‍යවස්ථාව යටතේ දේශපාලන විධායකය වූයේ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය යි. අගමැති ජාතික රාජ්‍ය සභාවේ බහුතර විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා ය. අගමැතිවරුන් සහ අමාත්‍යාංශය තීරණය කිරීම, අමාත්‍යවරුන්ගේ විෂය සහ කාර්ය භාරය තීරණය කිරීම අගමැති සතු කාර්යය විය.

අමාත්‍යවරුන් පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීමට මෙන් ම අමාත්‍ය ධුරවලින් ඉවත් කිරීමට ද, අගමැතිවරයාට බලය තිබිණි. ඉහළ අධිකරණවල විනිශ්චයකරුවන් ත්‍රිවිධ හමුදා ප්‍රධානයන් කැබිනට් ලේකම්, අමාත්‍යංශ ලේකම්වරුන්, පත් කිරීම අගමැති සතුය.

එතෙක් පැවති ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි කොට, රාජ්‍ය සේවාවට අදාළ වගකීම් ඇමති මණ්ඩලය වෙත පැවරිණි.

ClassWork.LK

ClassWork.LK